***ISBN 978-955-4563-72-8***

# සුඛමරණය, පිළිබඳ සදාචාර දාර්ශනික විමසුමක්

**ඩී. ඩී. ආර්. ද සිල්වා**
**දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

**සංක්ෂේපය**

*ජීවත්වීමට මිනිසාට අයිතියක් තිබුණ ද මිය යාමට අයිතිය ඉල්ලා සිටීම තරමක් දුරට විවාදාත්මක කරුණකි. සුඛ මරණය යන්න සහන ඝාතනය, ආනායාස මරණය, සානුකම්පිත මරණය, සුඛ මෘත්‍යු ආදි විවිධ වූ නම්වලින් හඳුන්වනු ලබන අතර බහුලව භාවිතා වනුයේ සුඛමරණය යනවෙනි. දර්ශනය නමැති විෂය ක්ෂේත්‍රය තුළ ආචාරධර්මීය විග්‍රහයන් යටතේ මෙම විද්‍යාත්මක ගැටලුව සදාචාරාත්මක වශයෙන් කෙතරම් දුරට යෝග්‍ය වූවක් ද නොවේ ද යන්න විෂයානුබද්ධ උභතෝකෝටික ගැටලුවකි. සදාචාරය සංස්කෘතියට, කාලයට අනුරූපීව හා දේශයට අනුරූපීව වෙනස් වේ. කාලීන වශයෙන් වැදගත් වන සුඛමරණය යන්න දාර්ශනික පසුබිම මත පිහිටා සදාචාරාත්මකව සාධාරණීකරණය කල හැකි ද යන්න තර්කානුකූලව විමර්ශනය කිරීම මෙම ලිපියේ අරමුණ වේ.*

*මුඛ්‍ය පද*

## හැඳින්වීම

සිංහල භාෂාවෙන් සුඛ මරණය ලෙසින් ව්‍යවහාර කරනු ලබන Euthanasia යන්න ඉංග්‍රීසි වචනය සංක්ෂිප්ත ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයෙහි අර්ථ දක්වා ඇත්තේ, ''සුව කළ නොහැකි සහ වේදනා සහගත රෝගයකින් පීඩා විඳින පුද්ගලයෙකු වේදනා විරහිත මරණයට ලක් කිරීමයි. (The painless killing of a patient suffering from an incurable and painful disease) (Oxford Advance dictionary, 1995, P. 411). එමෙන්ම “Euthanasia” යන වචනයසකස් වී ඇත්තේ යහපත යන අරුත් සහිත “EU” සහ මරණය යන අරුත් සහිත “thanatos'' යන ග්‍රීක වදන් එක්වීමෙනි. සුඛමරණය නැමති විෂය පිළිබඳව 1975 වර්ෂයේ දී ඇමෙරිකාවේ සිදු වූ සිදුවීමක් පසුබිම් වීම මුල්කොටගෙන ලෝකයේ අවධානයට යොමුවිය. මෙහිදී මූලික වශයෙන් සුව කළ නොහැකි රෝගයක් සම්බන්ධයෙන් පීඩා විඳින රෝගියකුගේ යහපත උදෙසා මරණයට ලක් කිරීම හරහා සිදුවන මනුෂ්‍යය ඝාතනය වූ කලී උභතෝකෝටිකයකි.

එමෙන්ම වෛද්‍ය විද්‍යාත්මක මෙන්ම ජෛව ආචාර්ය පද්ධතීන් ඇතුළත ද විවිධ වාද විවාද ඉදිරිපත් වී තිබේ. යහපත් අවසානයක් හෙවත් good death හෝ dying well යන්න වේදනාවෙන් තොරවීමයි. මේ අනුව සුඛමරණය ස්වභාවය අනුව ඊට ලක්වන්නාගේ දෘෂ්ටියෙන්, පුද්ගලයා අනුමත කරන ආකාරය අනුව සුඛමරණය සිව් ආකාර වේ.

01. ස්වෙච්ඡානුගත නොවන සුඛමරණය (In voluntary Euthanasia)
    මෙහිදී ඉබේ සිදුවන සුඛමරණය සිදුවන්නේ රෝගියාගේ කැමැත්තට එරෙහිව වන අතර සුව කළ නොහැකි බව දැන දැනම රෝගියෙකු වුවද මරණය නොගැනීම ප්‍රතික්ෂේප කළ හැකිය.

02. ස්වෙච්ඡානුගත සුඛමරණය (Voluntary Euthunasia)
    සිය ජීවිතය අවසන් කිරීම සඳහා පියවරක් ගන්නා ලෙස රෝගියා වෛද්‍යවරයාගෙන් ඉල්ලා සිටින අතර වෛද්‍යවරයා එසේ පියවර ගනු ලබයි.

03. පූර්ව ස්වෙච්ඡානුගත සුඛමරණය
    අනාගතයේ දී යම් දිනෙක සිදුවිය හැකි තමාගේ කායික හෝ මානසික අඩපනවීමක දී සිය ජීවිතය අවසන් කරන ලෙස ඉල්ලීමක් කල් ඇතිව ප්‍රකාශ කිරීමත් ඒ අනුව ක්‍රියා කිරීමටත් මෙහි දී සිදුවේ.

04. ස්වෙච්ඡාව නොලද සුඛමරණය (Non – voluntary Euthunasia)

***ISBN 978-955-4563-72-8***

මෙය රෝගියා හට ජීවිතය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට හෝ ඉල්ලීමක් කිරීමට නොහැකි තරම් අසාධ්‍ය තත්ත්වයේ පසුවේ නම් වෛද්‍යවරුන් හා නිලධාරීන් විසින් ඒකමතිකව තීරණයට එළඹ අනියම් ලෙස මරණය ළඟා කර දීමය.

(Baum, P., & O' Malley, E. 1999, pp 150-151)

අධ්‍යයනයේ පහසුව සඳහා තව දුරටත් පහත සඳහන් පරිදි ද සුඛමරණය කොටස් 2 කට පෙන්වා දිය හැකිය. එනම්,

01. සක්‍රිය සුඛමරණය (Active Euthanasia)
එනම් රෝගියා මරණයට පත් කිරීමේ අරමුණ ඇතිව ගනු ලබන ධනාත්මක පියවරක් ක්‍රියාවට නැගීමයි. මරණය සඳහා රෝගියාට ආධාර කිරීම මින් අධ්‍යහාර වේ. නිදසුනක් ලෙස මරණය ඇති කරවන සුළු රසායානික ද්‍රව්‍යයක් (ඖෂධ, එන්නත්) පුද්ගලයාගේ ශරීරගත කිරීම පෙන්වා දිය හැකිය. නෙදර්ලන්තයේ සහ ලක්ෂම්බර්ග් වැනි රටවල මෙය නීත්‍යානූකුල වේ.

02. අක්‍රිය (නිෂ්ක්‍රිය) සුඛමරණය (Passive Euthanasia)
එනම් ඖෂධ යෙදීම නවතා දැමීම, ජීවිතය පවත්වාගෙන යාම පිණිස ඔහුගේ ශරීරයට සවිකර තිබෙන වෛද්‍යමය යන්ත්‍රෝපකරණ ඉවත් කිරීම, සැත්කම් කිරීම නැවැත්වීම වැනි නිශේධනාත්මක ක්‍රමයන් මගින් ''ස්වාභාවික'' මරණයට පත්වන්නට ඉඩ හැරීමයි (Cohen, J. S. & others, 1994, P. 55).

**සුඛමරණය යන්න සදාචාරත්මක වශයෙන් සාධාරණීකරණය කළ හැකි ද?**

මෙම උභතෝකෝටික සදාචාර ගැටලුව ප්‍රධාන සදාචාරාමය දාර්ශනික ප්‍රවේශයන් සිව් ආකාරයන්ට අනුව දක්වන විග්‍රහයන් පිළිබඳ සලකා බැලිය හැකිවේ.

1. සාද්‍යතාවාදී ප්‍රවේශය (Teleological Approach)
2. යුක්ත්‍යාත්මවාදී ප්‍රවේශය (Deontological Approach)
3. උපයෝගීතාවාදී ප්‍රවේශය (Utilitarianiasm Approach)
4. සාපේක්ෂකවාදී ප්‍රවේශය (Relaivism Approach)

**සාද්‍යතාවාදී ප්‍රවේශය හා සුඛමරණය**

ඩබ්. කේ. ෆ්‍රැන්කීනා පවසන පරිදි ''සදාරයෙහි ප්‍රධාන ගැටළුව වන්නේ අප හොඳ-නරක, හරි-වැරදි, යුතු-අයුතු, ආදී වශයෙන් සදාචාරාත්සක සන්දර්භවල දී කරන නිගමන සඳහා හේතු සහිත පදනමක් ඇති ද යන්නය. මෙම ගැටළුවට විසඳුම් ඉදිරිපත් කළ ප්‍රාමාණික සිද්ධාන්තයක් වූයේ සාද්‍යතාවාදයයි. සාද්‍යතාවාදී න්‍යාය අනුව සදාචාරාත්මක වශයෙන් නිවැරදි, වැරදි බැඳීමෙන් යුක්ත, ආදී දෙය සඳහා මූලික හෝ අවසාන මිණුම් දණ්ඩ හෝ ප්‍රමිතිය, බිහි කෙරෙනු ලැබෙන න-සාදාචාරාත්මක අගයයි. අවසාන වශයෙන් ඍජුව හෝ වක්‍රව අවධානය යොමු කළ යුතු වන්නේ සන්සන්දනාත්මකව බිහි කරනු ලැබූ යහපත පිළිබඳවය. එසේ නැතහොත් හොඳ සහ නරක තුලනය කිරීමේ දී බිහි වූ හොඳෙහි අතිරික්තය පිළිබඳවය (Dunn. I. 1994. P. 21). මේ අනුව එම ප්‍රවේශය මඟින් අක්තරා අර්ථයකින් සදාචාරාත්මක බැඳීම පිළිබඳ න්‍යාය සහ සදාචාරාත්මක අගය පිළිබඳ න්‍යාය න-සදාචාරාත්මක අගය පිළිබඳ න්‍යාය මත පදනම් කර ගනී. යමක් නිවැරදි ද, කළ යුතු ද හෝ සදාචාරාත්මක වශයෙන් හොඳ ද දැන ගැනීම පිළින කෙනෙකු විසින් පළමු කොට න-සදාචරාත්මක වශයෙන් කුමක් හොඳ වන්නේ දැයි දත යුතුය.

සාද්‍යතාවාදීන් බොහෝ සිට හොඳ සුඛය සමඟද, නරක දුක සමඟ අන්‍ය වන බව දක්වමින් සුඛපරමවාදී ස්ථාවරයක් ගෙන ඇත. මේ අනුව නිවැරදි ක්‍රියා මාර්ගය හෝ ක්‍රියා කිරීමේ රීතිය වන්නේ ඕනෑම විකල්පීය ක්‍රියා මාර්ගයක් මඟින් උත්පාදනය විය හැකි දුක හා සතුට තුලනය කිරීමේ දී දුක ඉක්මවා ලබන සතුටෙහි අතිරික්තය තරම් විශාල වූ ප්‍රමාණයකටවත් සතුට උත්පාදනය කෙරෙන ක්‍රියා මාර්ගය හෝ ක්‍රියා කිරීමේ රීතියයි. න-සදාචාරාත්මක වශයෙන් කෙරෙන පරම

ISBN 978-955-4563-72-8

නිෂ්ටාවේ ස්වභාවය සම්බන්ධයෙන් සාද්‍යතාවාදීන් අතර විවිධ මතභේද තිබිය හැකිය. සුඛපරමවාදය යනු ප්‍රතිඵලවාදයක් වන සාද්‍යතාවාදයට සමීප වාදයකි. පරම සුවය අරමුණු කරගත් වාදය සුඛපරමවාදය වේ. මෙහිදී ''පරම සුවය'' යනුවෙන් අදහස් කරන්නේ කවුරුන්ගේ සුවයද යන කරුණ මත සුඛපරමවාදීන් කොටස් දෙකකට බෙදෙති. තමාගේ වැඩිම සුවය වර්ධනය කෙරෙන ක්‍රියාවක් කළ යුතු බව කියැවෙන වාදය, සදාචාරාත්මක වැඩිම යහපත විය යුතු බව කියැවෙන වාදය '' සදාචාරාත්මක සර්වාර්ථවාදය'' හෙවත් උපයෝගීතාවාදය වේ (වීරවර්ධන සුමේධ, 2007, පි. 121). පුද්ගලයන් විසින් සිදුකරනු ලබන ක්‍රියා, ප්‍රතිඵල අනුව තීරණය කිරීමේ දී බුදුදහම වැදගත් කරුණු දෙකක් කෙරෙහි අවධානය යොමු කරන බව පී. ඩී. ප්‍රේමසිරි මහතා පවසයි. ඔහුට අනුව ඒ කරුණු දෙක වන්නේ ''අපේක්ෂිත ක්‍රියාව සෘජුවහෝ දුරස්ථ වශයෙන් නිවන හා සම්බන්ධ වන්නේ ද යන්න හා එය කෙනෙකුගේ සංසාරික පැවැත්මෙහි තත්ත්වය අභිවර්ධනය කෙරේද යන්යත්ය.'' සාද්‍යතාවාදයේ දී ඒ ඒ පරම නිෂ්ටාවන් සම්බන්ධයෙන් ඉහත කී පළමු කරුණ අවධානය යොමු වී තිබුණද දෙවැනි කරුණ සම්බන්ධයෙන් අවධානයක් යොමු කරන බවක් පෙනෙන්නට නැති බැවින් එයද බෞදධ ආචාර විද්‍යාවේ සුවිශේෂි තත්ත්වයක් බව පෙනේ (ප්‍රේමසිරි පී. ඩී, 1992, පි. 33).

සාද්‍යතාවාදී න්‍යායට අනුව අයහපත ඉක්මවා යහපතෙහි අතිරික්තයක් බිහි කරනු ලබයි. ඒ අර්ථයෙන් සුඛමරණය යන්නද අයහපත ඉක්මවා යහපතෙහි අතිරික්තයක් බිහි කරන ක්‍රියාවක් ලෙස ගත හැකියි. වේදනාව ඉවසා ගත නොහැකි රෝගීයෙකු විසින් සුඛමරණය ඉල්ලා සිටීම සාද්‍යතාවාදී න්‍යායට අනුව වැරදි යැයි කිව නොහැකිය. සාද්‍යතාවාදය එක්තරා ආකාරයක ප්‍රතිඵලවාදයකි. ඊට අනුව කිසියම් ක්‍රියාවක් කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය, එම ක්‍රියාව කිරීම හෝ නොකිරීම සඳහා බලපාන බව පෙනේ.

සුඛමරණය යටතේ මරණය අභියස රෝගියෙකුට වේදානාවෙන් තොර මරණයක් ලබාදීම සිදු කරයි. මේ අනුව නිෂ්ටාව හෙවත් අරමුණු යහපත් වූවකි. එකී යහපත් චේතනාව තුලින් ලැබෙන ප්‍රතිඵලය රෝගියාට සුඛය හොවත් සතුටක් ලබාදීමයි. රෝගියාගේ වැඩිම සුඛය වර්ධනය කෙරෙන ක්‍රියාවක් සුඛ මරණය හරහා සිදුවේ. එය සදාරාත්මක ආත්මාර්ථවාදයට පක්ෂපාතී වෙයි. සුඛමරණය පමර සුඛයක් නොවෙයි. මන්ද එය වැඩිම දෙනෙකුගේ වැඩිම යහපත පිණිස නොවන හෙයිනි. ඒ අනුව සුඛමරණය සදාචාරමය සර්වාර්ථවාදයට විපක්ෂය. සුඛය හැර වෙනත් දේවල් පරම යහපත් ලෙස සලකනු ලබන පිරිස් ද සිටින බැවින් ලොව සියලුම උපයෝගීතාවාදීන් සුඛපරමවාදීන් ලෙස ගත නොහැකිය.

### යුක්ත්‍යාත්මවාදී න්‍යාය හා සුඛමරණය

සාද්‍යතාවයට විරුද්ධ වාදය ලෙස සැලකිය හැකි යුක්ත්‍යාත්මවාදය අනුව ක්‍රියාවක් හෝ රීතියක් නිවැරදි හෝ සදාචාරාත්මක බැඳීමෙන් යුතු බවට පැමිණෙන්නේ එහි ප්‍රතිඵලය අනුව නොවේ. ප්‍රතිඵලය හැර සලකා බැලිය යුතු එම ක්‍රියාවට හෝ රීතියට ම අයත් වැදගත් ලක්ෂණ තිබිය හැකිය. යම් ක්‍රියාවක් පොරොන්දු කඩ කිරීම, යුක්ති සහගත වීම වැනි විශේෂ ලක්ෂණයකින් යුතු වීම එහි සදාචරාත්මක ස්වරූපයට එම ක්‍රියාවේ ප්‍රතිඵලයට වඩා අදාළ වන බව යුක්ත්‍යාත්මවාදීන් මතයි.

ෆ්‍රැන්කීකා විසින් යුක්ත්‍යාත්මවාදීයෙහි ස්වරූප දෙකක් පවතින බව පෙන්වා දෙයි. එනම්, ක්‍රියා යුක්ත්‍යාත්මවාදය සහ රීති යුක්ත්‍යාත්මවාදය වේ. ක්‍රියා යුක්ත්‍යාත්මවාදයෙන් අදහස් කෙරෙන්නේ සෑම විශේෂ අවස්ථාවකදීම නිවැරදි ක්‍රියාව ඒ අවස්ථාව අනුව තීරණය කළ යුතු බවයි. මේ අනුව සුඛමරණයද විශේෂ අවස්ථාවක් වන බැවින් නිවැරදි ක්‍රියාව ඒ අවස්ථාව අනුව තීරණය කළ යුතු වේ. වේදනාවෙන් මරණය අභියස සිටින රෝගියෙකු සිටින තත්ත්වය (අවස්ථාව) අනුව තීරණය කරයි. ක්‍රියා යුක්ත්‍යාත්මවාදීන් සිතන පරිදි විශේෂ අවස්ථාවක දී නිවැරදි කුමක් ද? යන්න ප්‍රතිභාණයට ගෝචර වේ (Callahan, J. 1994, PP. 45-47). ක්‍රියා යුක්ත්‍යාත්මවාදී න්‍යාය වලට විරුද්ධ තර්ක කිරීමේ මාර්ග දෙකක් ඉදිරිපත් කළ හැකිය. පළමුවෙනි තර්කය වඩාත්ම විරුද්ධ වන්නේ දැඩි අන්තවාදී ස්වරූපයක් ගන්නා ඒවාට වන අතර අනෙක ඒ සියලුම වාදයන්ට විරුද්ධව යයි. පළමු තර්කය නම් ප්‍රායෝගික වශයෙන් ද රීති වලින් තොරව ක්‍රියා කිරීම අපට කළ නොහැක්කක් බවය. ඒ සඳහා එක් හේතුවක් නම් සෑම අවස්ථාවක ම අමුතුවෙන් විනිශ්චය කිරීමට අවශ්‍ය වන කාලය උත්සාහය අපට හැමවිටම යෙදිය නොහැකි බවයි.

ක්‍රියා යුක්ත්‍යාත්මවාදීන්ගේ මතය අනුව වේදනාවෙන් පසුවන රෝගියකු සුඛමරණය සඳහා වෛද්‍යවරයාගෙන් ආයාචනා කරන අවස්ථාවක දී X විසින් හෝ අන් අන් කිසිවෙකු විසින් කළ

***ISBN 978-955-4563-72-8***

යුත්තේ මෙය යන්නත් සමාන අවස්ථාවන්හි X විසින් හෝ අන් කිසිවෙකු විසින් කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳව කිසිවක් ගම්‍ය නොවේ. ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියා යුක්තියාත්මවාදී න්‍යාය පිළිගත නොහැකි බැවින් රීති යුක්තියාත්මවාදී න්‍යාය ඉදිරිපත් වී ඇත. රීති යුක්තියාත්මවාදය මඟින් අවධාරණය කෙරෙන්නේ තෝරා ගැනීමේ දී, විනිශ්චය කිරමේ දී, සදාචාරාත්මක කෂේත්‍රයේ තර්ක කරන විට, හේතු යුක්ති දක්වීමේ දී, යටත් පිරිසෙන් අධ්‍යහාරයෙන්වත් රීති හෝ මූලධර්ම කෙනෙකු විසින් පණවනු ලබන බවයි. ෆ්‍රැන්කීකා මෙහිදී පෙන්වා දෙන්නේ එබඳු රීති පද්ධතියක් සාර්ථකව ගොඩනැගූ යුක්තියාත්මවාදීන් ආචාර විද්‍යාඥයෙකු දකින්නට නැති බවයි.

යුක්තියාත්මවාදීන්ගේ පදනම් රීති ලබා ගන්නා පිළිබඳවද ගැටලු ඇත. සියලු තීරණ ගැනීම සඳහා එකී පදනම් මූලධර්මයක් ඇතැයි පිළිගන්නා යුක්තියාත්මවාදියෙකුට මූලධර්ම අතර ඇති විය හැකි ගැටුම පිළිබඳ ගැටලුව මඟ හැරිය හැකි වේ. මේ සඳහා නිදසුනක් වශයෙන් කාන්ට්ගේ මූලධර්මය ගත හැකි බව ෆ්‍රැන්කීකා පෙන්වා දෙයි. එහෙත් කාන්ට්ගේ නියමයද සදාචාරයට පටහැනි වූ නියම මොනවාදැයි පෙන්වා දීමට උපකාර කරගත හැකි නමුත් සදාචාරයට අනුකූල වූ නියම මොනවාදැයි තීරණය කිරීමට උපකාර කරගත නොහැකි වේ. නමුත් එම සීමා සහිත කාර්යයන්හි දී ද කාන්ට්ගේ මිණුම් දණ්ඩ අවශ්‍ය වන නමුත් සෑහෙන්නේ නැති බව ෆ්‍රැන්නීකා තර්ක කරයි. සුබමරණය කිසිදු විටක සිදු කර නොහැකිය යන්න පිළිගතහොත් ඒ කිසිදු විටක සිදු කර නොහැකිය යන රීතිය සඳහා අන්‍ය අස්ථාවක් වෙයි. ''සම්‍යක් ප්‍රයෝග ලෙස බොරු කීම, සුබමරණය සිදුවන අවස්ථාවන්වල දී හැර අප විසින් කිසිදු විටක බොරු නොකිව යුතුය, සුබමරණය නොකළ යුතුය'' යැයි කියන බව සිතමු.

මේ සුපුරුදු විරෝධතාවයෙන් පෙන්වා දී ඇති දුෂ්කරතාවල සම්බන්ධව මෙහිදී දක්වූ ආකාරයට යුක්තියාත්මවාදියෙකු වූ ඩේවිඩ් රොස් සාමිතුමා කටයුතු කරයි. එහෙත් ඔහුට තවත් අර්ධ පිළිතුරක් ඇත. ඔහු සැබෑ යුතුකමක් බැලූ බැල්මට යුතුකම වශයෙන් පෙන්වන යුතුකමත්, සැබැවින්ම නිවැරදි වූ ක්‍රියාවක් බැලූ බැල්මට නිවැරදි සේ පෙනෙන ක්‍රියාවක් අතර වෙනසක් දක්වයි. සැබවින්ම නිවැරදි වූ හෝ සාදාචාරාත්මක බැඳීමෙන් යුක්ත වූ හෝ දෙය නම් කිසියම් විශේෂ අවස්ථාවක අප විසින් සැබවින්ම කළ යුතු දෙයයි. සුබමරණය නිර්දේශ කිරීම වෛද්‍යවරයෙකුගේ යුතුකමක් ලෙස ගනිමු. නමත් ඒ අතරට සදාචාරාත්මක කරුණු පැමිණේ. වෛද්‍යවරයෙකු විසින් අවසාන මොහොත දක්වා රෝගියෙකු ජීවත් කළ යුතුය. කිසිදු විටක පුද්ගලයෙකු සුබමරණයට පත් කළ නොහැකිය. එලෙස සදාචාරාත්මක කරුණු ඒ අතරට නොපැමිණේ නම් එය සැබෑ යුතුකමක් ලෙස බැලූ බැල්මට පෙනේ. එහෙත් දෘෂ්‍යමානව, යුතුකම් වන යුතුකම් මොනවාදැයි මිණුම් දණ්ඩක් රොස්ට දීමට නොහැකි වීම දුර්වලතාවයකි. එහෙත් වචනයෙන් ප්‍රකාශ කෙරෙන්නේ නම් සදාචාරාත්මක වශයෙන් නිවැරදි හෝ වැරදි වන්නේ කුමක් දැයි තීරණය කිරීම පිණිස සෑම විටම කවර කරුණු සැලකිල්ලට ගත යුත්තේ ද යන්න සඳහා මිණුම් දණ්ඩක් දිය නොහැකි වීමයි. මේ අනුව ක්‍රියා යුක්තියාත්මවාදය මෙන්ම රීති යුක්තියාත්මවාදය සුබමරණය සම්බන්ධ වන්නේ තුළ ද විවිධ දුර්වලතා පවතින බවත් පෙනේ (Munn, R. 1994, P. 171).

**උපයෝගීතාවාදී ප්‍රවේශය හා සුබමරණය**

උපයෝගීතාවාදය පිළිබඳ ප්‍රේමසිරි මහතා අදහස් දක්වන්නේ, උපයෝගීතාවාදය නිර්වචනය කිරීම සඳහා නිශ්චිතතාවයකින් යුත් ක්‍රම ඇත. එහෙත් එම පදය මා උපයෝගී කර ගන්නා පරිදි මා අදහස් කරන්නේ හරි, වැරදි, සදාචාරාත්මක බැඳීමෙන් යුතුය යන්න සඳහා තනි, අවසාන ප්‍රමිතිය, උපයෝගීතාවාදය පිළිබඳ මූලධර්මය හෙවත් යහපත පිළිබඳ මූලධර්මය වන බවයි. ඉතාම දැඩි ලෙස කියනු ලබන්නේ අප කරන සියලු දෙයින් අප සොයා ගත යුතු සදාචාරාත්මක අරමුණ නම් අයහපත ඉක්මවා යහපතේ විශාලතම අතිරික්තයක් (හෝ යහපත සමඟ සැසැඳීමේ දී අයහපතේ අවමයක්) බිහි කිරීමයි (ප්‍රේමසිරි, පී. ඩී. 1998, පි 110). පරිමාණ හතකට අනුව සුඛය හා දුක්ඛය පිළිබඳ සුඛවින්දනාත්මක කලනයක් ජෙරමි බෙන්තම් විසින් සැකසීමට යත්න දැරීමේ දී මේ ඉතා ප්‍රකටව පිළිගනු ලැබිණි. එම සප්ත පරිමාණ නම් තීව්‍රතාව, කල්පැවැත්ම, නිසැකබව, ආසන්නතාව, පාරිශුද්ධතාවය සහ ප්‍රමාණයයි. ආස්වාද අගය කිරීමේ දී එක් අතකට මෙය ප්‍රතික්‍රියාවක් වශයෙන් ප්‍රමාණය මෙන්ම ගුණයද හඳුන්වා දීමට ජෝන් ස්ටුවර්ට් මිල් සිතා ඇත. එහෙත් කෙනෙක් මෙසේ කරන්නට ඉදිරිපත් වුවහොත් උපයෝගීතා මිණුම් ප්‍රකාශ කළ යුත්තේ කෙසේද යන්න අවබෝධ කර ගැනීම දුෂ්කරය.

*ISBN 978-955-4563-72-8*

පරම නිෂ්ටාවේ ස්වරූපය පිළිබඳ දක්වන අදහස් සැලකිල්ලට ගෙන උපයෝගීතාවාදීන් කොටසක් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්, ඒකත්වවාදීන් සහ බහුත්වවාදීන් වශයෙනි. පරම නිෂ්ටාව වන සැපයේ ප්‍රභේද නැති බව පවසන අය ඒකත්වවාදීන් වන අතර ඔවුන්ට අනුව සතුට, යහපත, සොම්නස, සැපය යනාදී සෑම වචනයකින්ම කියවෙන්නේ එකම අදහසකි. සැපත පමණක් නොව නිදහස, ඥානය, සෞන්දර්ය ආනුභූතිය ආදියද පරම නිෂ්ටාවක් ලෙස සැලකිය හැකි බව බහුත්වවාදීන්ගේ අදහස වේ.

උපයෝගීතාවයේ තවත් ප්‍රභේද දෙකක් දැක්විය හැකිය. එනම් ක්‍රියා උපයෝගීතාව සහ රීති උපයෝගීතාවය යනුවෙනි. ක්‍රියා උපයෝගීතාවට අනුව යහපතෙහි උපරිම තත්ත්වය ලබා ගැනීම සඳහා අවධානය යොමු කළ යුත් වන්නේ රීතින් පිළිබඳව නොව එළඹී ඇති විශේෂ අවස්ථා වෙතය. සොක්‍රටීස්ට තම මරණය හමුවේ ක්‍රියා කළ ආකාරය දෙස බලන විට ඔහු රීති උපයෝගීතාවාදියෙකු ලෙස කටයුතු කර ඇති බව පිළිගත හැකිය. තම මිතුරන් හා හිතුවතුන් සිරගෙයින් පැන ගියා නම් මරණයෙන් ගැලවීමට ඔහුට හැකි වන්නට ඉඩ තිබිණි. ඔහු එසේ නොකළේ රජයත්, සොක්‍රටීසුත් අතර ඇති ගිවිසුම කඩවන බැවින් යැයි ඔහු පවසයි (Hansen, M. 1995, P. 45). ක්‍රියා උපයෝගීතාවාදීන්ගේ පිළිගැනීම වන්නේ බහුතරයකගේ සතුට සඳහා වන ක්‍රියාව නිවැරදි බවය. ක්‍රියාවක නිවැරදි බව හෝ වැරදි බව රඳා පවතින්නේ මිනිසුන්ගේ හැඟීම් හා චේතනාවෙන් මත බව චිත්තවේගීවාදීන්ගේ පිළිගැනීමයි.

ක්‍රියා උපයෝගීතාවාදය සඳහා සුඛමරණය යන සදාචාරාත්මක ගැටලුව ආදේශ කළ විට බහුතරයකගේ යහපත වෙනුවෙන් සුඛමරණය නිර්දේශ කිරීම වරදක් නොවේ. වේදනාව ඉවසා ගත නොහැකි, මරණයේ දොර අභියස සිටින රෝගියෙකුගේ දුකට පිළියමක් ලෙස සුඛමරණය සිදු කළ හැකිය. රෝගියාගේ ඥාතීන්ද රෝගියා නිසා දුකට පත්වෙයි. මෙවැනි අවස්ථාවක බහුතරයකගේ සැපත, සතුට වෙනුවෙන් රෝගීයා සඳහා සුඛමරණය නිර්දේශ කිරීමට වෛද්‍යවරයාට හැකියාව ඇත. ක්‍රියා උපයෝගීතාවාදයට අනුව මෙතුළින් අයහපත ඉක්මවා යන යහපතෙහි විශාල අතිරික්තයක් එම ක්‍රියාව මඟින් උත්පාදනය කෙරෙයි.

රීති උපයෝගීතාවාදීන්ට අනුව ආචාර ධර්මයට පටහැනි ක්‍රියා සිදුකරනු නොලැබේ. ක්‍රියා උපයෝගීතාවාදීන් මෙන් රීති උපයෝගීතාවාදීන් අවස්ථාවාදීන් ලෙස කටයුතු කරනු නොලබයි. සමාජ සම්මත ආචාරධර්ම, නීතිරීතිවලට ගරු කරන රීති උපයෝගීතාවාදීන් කවර තත්ත්වයක වුවද සුඛමරණය වැනි තත්ත්වයක් නිර්දේශ නොකරනු ලබයි. ක්‍රියා උපයෝගීතාවාදීන් පෙන්වා දෙන පරිදි එය බහුතරයකගේ සතුට, සැපත, යහපත විය හැකිය. නමුත් සුඛමරණය ආචාරධර්මීය ගැටලුවකි. එනම්, මිනිස් ජීවිත පිළිබඳ ගැටලුවකි. වෛද්‍යවරයාගේ යුතුකම, වගකීම විය යුත්තේ අවසාන මොහොත දක්වා ජීවිතයක් බේරා ගැනීමට සටන් කිරීමට බව සමාජය සහ සදාචාරාට පක්ෂ මතයකි. කොතරම් වේදනාවෙන් පසුවුවද, මරණය අභියස සිටින රෝගියෙකු සුඛමරණය ආයාචනා කරනු ලැබුවද, එවැනි සමාජය සාදාචාරය රීතියක් උල්ලංඝනය කිරීමට රීති උපයෝගීතාවාදීන් මැළිවෙනු ලබයි (Philipps, Foot. 1979, PP. 125-128).

**සාපේක්ෂකවාදය සහ සුඛමරණය**

සාපේක්ෂකවාදියාගේ තර්කය වනුයේ කිසියම් මතයකට විරුද්ධව අපක්ෂපාති සහ කරුණු පිළිබඳ අවබෝධයෙන් යුත් පරීක්ෂණයක් අනුව සියලු විරුද්ධවාදීන්ට එරෙහිව තහවුරු වීම යන අර්ථයෙන් වාස්තවික වශයෙන් සහ බුද්ධිගෝචර වශයෙන් යුක්ති යුක්ත වන්නේ හෝ සප්‍රමාණ වන්නේ යන මේ ප්‍රතිඥාව පැහැදිලිව දොස් සහිත බවට ද එය අත්හැරිය යුත්තක් බවටද වෙයි. හරි, වැරදි අදහස් ඉතිහාසයේ විවිධ යුගයන්ට අනුව විවිධ සමාජයන්ට අනුව වෙනස්ව ඇති බව සාපේක්ෂතාවාදීන්ගේ මතයයි. මෙම සංකල්පය යමක් පිළිගනු ලබන්නේ නම් විවිධ රටවල ක්‍රියාත්මක කරනු ලබන සුඛමරණය පිළිගත යුතුද? තාර්කික යථානුභූතවාදීහු ආචාර සංකල්ප අර්ථ ශූන්‍ය ඒවා ලෙස ප්‍රතික්ෂේප කරති. සාපේක්ෂකවාදයේ ස්වරූප තුනක් අතර වෙනස හඳුනාගනිමින් සුඛමරණය කෙලෙස සාපේක්ෂකවාදය තුළ අර්ථවත් වන්නේද යන්න විමසා බැලීම වටී. විස්තරාත්මක සාපේක්ෂකවාදය යනු සාපේක්ෂකවාදයේ ප්‍රධානතම න්‍යාය වේ. එය හුදෙක් මිනිසුන්ගේ සහ සමාජවල ආචාර විද්‍යාත්මක සහ ඇගයුම්ශීලී විනිශ්චය වෙනස් වන බව පමණක් නොකියයි. බටහිර රටවල බොහෝ ප්‍රාන්තයන්හි සුඛමරණය නීතිගත කොට ඇත. කිසිදු ලෙසකින් ජීවත් කරවිය නොහැකි, වේදනාවෙන් පසුවන රෝගීන් වෙනුවෙන් වෛද්‍යවරුන් විසින් සුඛමරණය වැනි තත්ත්වයක් නිර්දේශ කරනු ලබයි. මන්ද බටහිර රටවල දැනුම අධ්‍යාපනය, රුචි අරුචිකම්, ආවේග,

*ISBN 978-955-4563-72-8*

සංස්කෘතිය ආදී බොහෝ ලක්ෂණ ශ්‍රී ලංකාව, ඉන්දියාව වැනි රටවලට සාපේක්ෂ වන බැවිනි (Kushse, H. & Singer P. 1992, P. 182). සාපේක්ෂතාවාදයේ දෙවන ක්‍රමය වන්නේ අධිආචාර විද්‍යාත්මක සාපේක්ෂතාවාදයයි. මූලික ආචාර විද්‍යාත්මක සහ ඇගයුම්ශීලී විනිශ්චයක් සම්බන්ධයෙන් එකක් අනෙකට විරුද්ධව යුක්තිසහගත වන බව දක්විය හැකි වන වාස්තවික වශයෙන් සප්‍රමාණ බුද්ධි ගෝචර ක්‍රමයක් නැති බව එය විශ්වාස කරයි. සාපේක්ෂතාවාදයේ තෙවන ස්වරූපය නම්, සප්‍රමාණික සාපේක්ෂතාවාදයයි. විස්තරාත්මක සාපේක්ෂතාවාදය මානව විද්‍යාත්මකව හෝ සමාජ විද්‍යාත්මක පිළිගැනීමක් ඉදිරිපත් කරන අතර අධි ආචාර විද්‍යාත්මක සාපේක්ෂතාවාදය අධි ආචාර විද්‍යාත්මක වූවක් ඉදිරිපත් කරයි. ඒ අතර සාපේක්ෂතාවාදයේ මෙම ස්වරූප සප්‍රමාණික මූලධර්මයක් ඉදිරිපත් කරයි. අදාළ අවස්ථා සමාන වුවද එක් පුද්ගලයෙකුට නිවැරදි හෝ හොඳ වූ දෙය තවත් කෙනෙකුට නිවැරදි හෝ හොඳ නොවේ. මෙයින් අදහස් කරන්නේ හුදෙක් එක් කෙනෙකු විසින් නිවැරදි හෝ හොඳ බව සිතන දෙය තවත් කෙනෙකු විසින් නිවැරදි හෝ හොඳ බව නොසිතන බව පමණක් නොවේ. (මෙය නැවත විස්තරාත්මක සාපේක්ෂතාවාදය වෙයි) එහෙත් එක් අවස්ථාවක සැබවින්ම නිවැරදි හෝ හොඳ දෙය වන දෙය අනෙක් අවස්ථාවන්හි එසේ නොවනු බවයි. එබඳු සප්‍රමාණික මූලධර්මයක් අප කලින් සඳහන් කළ සංස්ථිතික භාවයේ සහ විශ්වසාධාරණකරණීය භාවයේ අවශ්‍යතාවය කඩ කරයි. මෙය සාපේක්ෂක වාදයේ අනෙක් ස්වරූප දෙකෙන් එකක්වත් පිහිට සෙවීමෙන් එහි යුක්ති යුක්තභාවය නොදක්විය හැකි බවද, එය ඒවායින් ගම්‍ය නොවන බවද පෙන්වාදීම හැර මෙහිදී සලකා බැලිය යුතු නොවේ.

සමහර සංස්කෘතික මානව විද්‍යාඥයින් සහ සමාජ මානව විද්‍යාඥයින් එහි සත්‍යතාව ප්‍රශ්න කර තිබේ. නිදසුනක් වශයෙන් රැල්ෆ් ලින්ටන් සහ ඇස්. ඊ. ඇෂ් සඳහන් කළ හැකිය. කෙසේ වෙතත් අධි ආචාර විද්‍යාත්මක සාපේක්ෂකවාදය ඔප්පු කිරීම පිණිස කෙනෙකු විසින් විස්තරාත්මක සාපේක්ෂතාවාදය ඔප්පු කිරීමට වැඩි යමක් කළ යුතුව ඇත. මිනිසුන් පිළිබඳ සමාන වූ අදහස් දැරීමේ දී පවා මිනිසුන්ගේ මූලික ආචාර විද්‍යාත්මක සහ ඇගයීම්ශීලී විනිශ්චය වෙනස් වන බව පෙන්වා දීම ප්‍රමාණවත් නොවේ. ඒ මක් නිසාද යත් එබඳු වෙනසක්ම් සියල්ල කලින් යොදා ගත් ප්‍රාථමික සමාජවල නිදසුන් මෙන්, සිද්ධිවාචක කරුණු පිළිබඳ විශ්වාස අතින් ඔහුගේ ඇති වෙනසක්ම් සහ අසම්පූර්ණතාවය නිසා විය හැකි වන හෙයිනි. මෙහිදී ප්‍රායෝගික වශයෙන් නොවූවත් මූලධර්ම වශයෙන්වත් සෑම කෙනෙකුටම සප්‍රමාණ වන බවට යුක්ති යුක්තව දක්විය හැකි මූලික ආචාර විද්‍යාත්මක හෝ ඇගයුම්ශීලී විනිශ්චය වන බව අදහස් කිරීමට තව දුරටත් හැකිවේ (Miles, S. 1994. P. 112). කෙසේ වෙතත් මිනිසුන් පූර්ණ වශයෙන් ප්‍රබුද්ධ වුවද, සංකල්පීය පැහැදිලිව ලබා ඇති වුවද, එසේම සිද්ධි වාචක, විශ්වාස සමානව දැරුවද, එක දෘෂ්ටි කෝණයකින් ගත්තද, ඔහුගේ මූලික ආචාර විද්‍යාත්මක හා ඇගයුම්ශීලී විනිශ්චය තව දුරටත් වෙනස් වනු ඇති බව පෙන්වීම සඳහා කෙනෙකුට මේ සියලු සාධක ඉටු වී මිනිසුන් තව දුරටත් වෙනස් මත දරන පැහැදිලි අවස්ථා යොදා ගත යුතු වේ. සාපේක්ෂතාවාදය අනුව සුබමරණය යනු ආචාර ධර්ම සංකල්පය එක් එක් පුද්ගලයාට, සමාජයන්ට සාපේක්ෂ වන බව පැහැදිලි වනු ඇත.

**නිගමනය**

බටහිර රටවල නීත්‍යානුකූල අවසරය මත වේදනා ඉවසාගත නොහැකි, මරණය අභියස සිටින රෝගීන් වෙනුවෙන් සුබමරණ නිර්දේශ කරනු බව පෙනේ. ඉතා පුළුල් මාතෘකාවක් වන සුබමරණය යන්න ක්‍රියාකාරීත්වය තුළින් දැඩි සංකීර්ණ බවක් උසුලයි. ආචාර ධර්මීය, මනෝ විද්‍යාත්මක, වෛද්‍ය විද්‍යාත්මක, නීතිය යන විවිධ පැතිකඩයන් ඔස්සේ ද සුබමරණය වූ කලී උභතෝකෝටික ගැටලුවකි. දාර්ශනික ප්‍රවේශයන් සුබ මරණය සිය න්‍යාය කෙරෙහි ආදේශ කරගනු ලබන ආකාරය එකිනෙකට වෙනස් වේ. සාද්‍යතාවාදය අභාපත ඉක්මවා යන යහපතේ අතිරික්තය පිළිබඳව මතයක් ඉදිරිපත් කරමින් සුබමරණය සියල්ලන්ගේ යහපත පිණිස වන්නේ නම් නිවැරදි බව පෙන්වා දෙයි. මෙම සාද්‍යතාවාදී මතය උපයෝගීතාවාදී න්‍යායට සමීපතාවයක් දක්වන අතර ක්‍රියා උපයෝගීතාවාදයෙන් රීති උපයෝගීතාවාදය වෙනස් වනු ලබයි. අවස්ථානුකූල පදනම මත ක්‍රියා උපයෝගීතාවාදීන් සුබමරණය නිර්දේශ කරනු ලැබුවද රීති උපයෝගීතාවාදීන් එය ප්‍රතික්ෂේප කරනු ලබයි. සාද්‍යතාවාදයට හා උපයෝගීතාවාදයට විරුද්ධ න්‍යායක් ලෙස ඉදිරිපත් වන යුක්ත්‍යාත්මවාදය ද සුබමරණය පිළිබඳ දරන මතය සංකීර්ණ වේ. යුක්ත්‍යාත්මවාදීන් ද ක්‍රියා යුක්ත්‍යාත්මවාදීන් හා රීති යුක්ත්‍යාත්මවාදීන් ලෙස බෙදී කටයුතු කිරීම තුළ එකී සංකීර්ණ බව තීව්‍ර වෙයි. සාපේක්ෂකවාදීන් ද සමස්තයක් ලෙස සලකා සුබමරණය යන්න එකිනෙකට සාපේක්ෂ වන සංකල්පයක් බව පෙන්වා දෙති. මෙම පසුබිම මත දාර්ශනික න්‍යාය සුබමරණය වැනි සදාචාරාත්මක සංකල්පයක් පිළිබඳ දරන මතය එකිනෙක දාර්ශනික න්‍යායන්ට සාපේක්ෂව වන බව නිගමනය කළ හැකිය.

***ISBN 978-955-4563-72-8***

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ප්‍රේමසිරි, පී. ඩී. (1992), බෞද්ධ ආචාර ධර්ම, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

ප්‍රේමසිරි, පී. ඩී. (1988), ආචාර විද්‍යාව, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, රාජ්‍ය සම්මානලාභී පොත් ප්‍රකාශකයෝ සහ බෙදා හරින්නෝ 675, පී. ද එස්. කුලරත්න මාවත, කොළඹ 10.

බ්‍රෝඩ්, සී. ඩී. (1996), ආචාර පංචවිධ ප්‍රභේද, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

වීරවර්ධන, සුමේධ (2007), ආචාර විද්‍යා අධ්‍යයන ලිපි (පෙර'පර දෙදිග විද්‍යා සංකල්ප හා සිද්ධාන්ත පිළිබඳ අධ්‍යයනයක්), කර්තෘ ප්‍රකාශනයකි.

ෆ්‍රන්කීනා, ඩබ්. කේ., ප්‍රේමසිරි, පී. ඩී. පරි. (1998), ආචාර විද්‍යාව, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10.

C. B. Becker (1990), *'Buddhist views of Suicide and Euthanasia' Philosophy East and west, 543-36.*
Cohen, J. S., Fihn, S. D., Boyko, E. J., Jonsen, A. R. (1994), *Attitudes toqard assisted Suicide and Euthanasia among Physicians in Washington State, New England Journal of Medicine.*
Cowie, A. P. (1995), *Oxford Advanced Dictionary,* Orford University Press, P-44.
Dunn, I (1994) *Relatives Keener o Euthanasia Than Patients,* British Medical Journal.
Dunn, I (1995) *The "Black Leter Law" on Euthanasia, In Deathand the state, papers presented to a Conference on Euthanasia,* University of Melbourne.
Hansen, M (1995), *Measuring Attitudes to Euthanasia,* Unpublished Honours Thesis, James Cook University.
Hayes, Carlton Joseph Huntley (1938), Christianity and Western Civilization.
Kuhse, H., & Singer, p (1988), *Doctor's Practices and Attitudes Regarding Voiuntary Euthanasia,* Medical Journal of Australia.
Kushse, H., & Singer, p (1992), *Euthanasia, A Survey of nurses' Atitiudes and Practices,* Australian Burses Journal.
Miles, S. (1994), *Physicians and Their Partients' Suicides* Journal of The American Medical Association.
Munn, R. (1994), *Attitudes and Practices of Euthanasia In The Victorian Medical Profession,* Unpublished Thesis, La Trobe Univeristy, Melbourne.
Philipps, Foot (1979), *'Euthanasia', Ethicla Issuess Relating To Life and Death,* Edited By john Ladd, Oxford University Press, Oxford.
R. Florida, (1993), Bddhist Approaches To Euthanasia', Studies In Religion (Sciences Religiuses, (35-47).